# අවරදිගට බුදුදහම ප්‍රියවන්නේ ඇයි?

**පියදස්සි ස්ථවිර**

බුදුරජාණන් වහන්සේ දඹදිව පහළවූයේ ක්‍රිස්තු පූර්ව හවැනි සියවසෙහි ය. මේ යුගය ලෝකයේ රටවල් කීපයක ම සාමාජික වශයෙන් මෙන්ම සාමයික, දර්ශනික වශයෙන් ද ක්‍රියාකාරී යුගයක් විය.

රෝමය, ග්‍රීසිය, චීනය, පර්සියාව, නූතන ඉරානය, ඉන්දියාව ආදී රටවල මෙසේ හොඳ අතට පෙරළියක් ඇතිවුණු බව ඉතිහාසය කියයි. මේ හෙයින් හවැනි සියවස ආගම් ඉතිහාසයේ රන්යුගය නැත හොත් මුදුන් යුගය හැටියට සැලකෙයි. ඒ එද ය.

අද ලෝකය මීට අවුරුදු පණහකට පෙර තිබුණු ලෝකයට වඩා වෙනස් ය. අද මිනිසා, මිනිසා දෙසත් සමාජය දෙසත් බලන බැල්ම බෙහෙවින් පෙරට වඩා වෙනස් ය. හොඳ නරක, ශිෂ්ට-අශිෂ්ට කම් මණින මිම්ම ද වෙනස්වුණු බවක් පෙනේ. ආගමික හෝ දර්ශනික ඉගැන්වීම් නිකම් කියන පලියට නො විමසා පිළි ගන්නට ද සූදනමක් නැත.

මෙයට ප්‍රධාන හේතු දෙකක් දක්ක හැකි ය. එකක් සීඝ්‍රව දියුණු වී පැතිර යන නවීන විද්‍යාව යි. අනෙක ප්‍රජාතන්ත්‍ර වාදය යි. අවරදිග වඩාත් බලපාන මෙදෙක අද පෙරදිග ද පැතිර යයි. මෙය නැවැත් විය හැක්කක් නො වේ.

දෙවන මහා සංග්‍රාමයෙන් පසුව යුරෝපයේ සහ ඇමෙරිකාවේත් මිනිසුන්ගේ ආගම භක්තිය, දේව විශ්වාසය හීනවෙගන යන බව ප්‍රකට කරුණකි. නෙත් පියා මුව අයා නොවිමසා යමක් ගිලදමන්නවුන් මෙන් පුරාතණයේ සිට පිළිගත් ආගමික විශ්වාසයන් හා ඇදහිලි, නොවිමසා පිළි ගන්නට මේ නවීන විද්‍යායුගයේ මිනිසුන්, විශේෂයෙන් අවරදිගුන්, සූදනම් නැත. තව පරම්පරාවක් ගිය තැන අවරදිග දේව ඇදහිලි ඇත්තවුන් සොයා ගැනීම අපහසු වෙනු ඇත යනු වියතුන්ගේ මතය වේ. බ්‍රිතාන්‍යයේ නම් එසේවිය හැකි බව ඉංග්‍රීසි ජාතික ජූලියන් හක්ස්ලි නමැති ජීව විද්‍යාඥයාගේ පිළිගැනීම යි.

විද්‍යාවත්, ප්‍රජාතන්ත්‍රවාදයත් තදින් බල පාන මේ යුගයේ මිනිසා ආගම ය දෙස බලන්නේත් ඒ දෙනෙතිනි. විද්‍යාවේ එන කරුණු මෙන් ම ආගමික ඉගැන්වීම් ද නිකම් කියන පලියට බාර නොගෙන නිරීක්ෂණයෙන් හා පරීක්ෂණයෙන් උරගා බලන්නට හේ උත්සුක වෙයි. හේතුඵල වශයෙන් බලනවිට ප්‍රොත්සාහි වෙයි. ආගමික ඉගැන්වීම්, ආගමික සංස්ථාවන් හා සංවිධානයන් කොතෙක් ප්‍රජාතාන්ත්‍රිකදැ යි සොයා බලන්නට රිසිවෙයි.

දැන් අපි ගෞතම බුදුරජාණන් වහන්සේ ක්‍රිස්තු පූර්ව හවැනි සියවසේදී සිය අනු-

ගාමිකයන්ට විමුක්තිමාර්ගයක් පහද දෙමින් ධර්මචක්‍රයක් පවත්වා මිනිස් සිත් තුළ විප්ලවයක් ඇතිකළ බෞද්ධ චින්තා වත් දෙස සිත් යොමුකොට බලමු.

බුදුසමය අංග සම්පූර්ණ විදුහුරු දර්ශන යෙකි. මිනිසාට ලෞකික ලෝකෝත්තරවූ ද අතීන්ද්‍රිය වූ ද ඥානය ලබාගන්නා ඥාන කාණ්ඩයක් ද මිනිසා හා බාහිර ලෝකය පිළිබඳ වූ ලෝක විභාගයක් ද මිනිසාගේ පරමාර්ථයන් හා ඒ සඳහා ගතයුතු, යා යුතු මාර්ගයන් පිළිබඳ වූ ආචාර ධර්ම පද්ධතියක් ද මිනිසාගේ ආර්ථික වූ ද සාමාජික හා දේශපාලනමය වූ ද කරුණු පිළිබඳ පැහැදිලි දර්ශනයක් ද ගෞතම බුදුරජාණන් වහන්සේ අවුරුදු 2500 කට පෙර දේශනා කළ ධර්ම විනයයෙහි දක්ක හැකිය. නිරීක්ෂණයට හා පරීක්ෂණයට බුදුදහම උසස් තැනක් දෙයි. නිරීක්ෂණය හා පරීක්ෂණය නැති තැන සත්‍යයට ළං වීමෙක් ද නැත. එතැන ඇත්තේ අඳුරේ අත ගෑමෙකි.

කිසිවක් අහේතුකව හෝ එක හේතුවක හෝ නො සිදුවන බවත් අනේක හේතුන් ප්‍රත්‍යයන් හා නියාමයන් නිසා සිදුවන බවත් බුදුදහම උගන්වයි. ''මා මනාව දෙසූ ධර්මය විවෘත වෙත් වෙත් ම බබළයි. සඟවත් සඟවත් ම නො බබළයි'' යන මේ රන් වැකිය අංගුත්තර නිකාය නම් ග්‍රන්ථයෙහි එයි. අද විද්‍යාඥයන් චක්‍රා වාටයන් ගැනත් ඉර - හඳ ග්‍රහ තාරකා වන් ගැනත් කතාකරතත්, සිය දහස් ගණන් ලෝකධාතු (චක්‍රාවාටයන් - සක්වළවල්) සිය දහස් හඳ හිරු ගැනත් පළමුවෙන් ම ප්‍රකාශ කළේ ගෞතම බුදුරජාණන් වහන් සේ ය. සූත්‍ර පිටකයේ එන සූත්‍ර ධර්මයන් ගෙන් එය පැහැදිලි ය. බුදුරජුන් ප්‍රජා තන්ත්‍ර ක්‍රමයේ ආදිකර්තෘ බව විනය පිටකයෙන්, සඟවිනයෙන් ඔප්පුකළ හැකිය. සෙට්ලන්ඩ් සාමි ''ඉන්දියාවේ උරුමය'' නමැති ග්‍රන්ථයට ලියූ පෙරවදනෙහි ද මේ බව සඳහන් කෙරෙයි.

අද උගතුන්, මනෝවිද්‍යාඥයන්, බුදු දහමේ එන පුනර්භවය හෙවත් නැවත ඉපදීම පිළිබඳ ඉගැන්වීම් දෙස බලන්නේ සැකමුසු සිතින් නොවේ. පුනර්භවය සනාථ කරවන නවීන විද්‍යාත්මක සාක්ෂ්‍ය ද අද සොයාගෙන ඇත. මිළින්ද ප්‍රශ්නයේ එන ඇතැම් කොටස් එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ 1920 දී ලියන ලද්දක් තරමට නවීන බව ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ න්‍යායාචාර්යයකු වැ සිටි එච්. එම්. ප්‍රයිස් නමැති, වියතාගේ පිළි ගැනීමයි. මෙසේ බුදුදහම යල්පැනගිය පුරාණ මතයන් ය කියා ප්‍රතික්ෂේප කළ නොහැකි, අදට පමණක් නොව, මතුවට ද ප්‍රජාවට අත්‍යර්ථයෙන් ගැළපෙන නිත්‍යනව දර්ශනයෙකි. අවුරුදු 2500 කට පෙර ප්‍රකාශ කළ බුද්ධ වචන තුළින් සත්‍ය ධර්මය දක්ක හැකි බව සාධාරණව අගති විරහිත ව කරුණු සෙවූ වියත්හු පිළිගනිති. ඕපන්හයිමර්, සෙට්ලන්ඩ් සාමි, ඌස් පෙන්ස්කි, ඕල්ඩස්හක්ස්ලි, ආචාර්ය බැෂම් ඉන් කීප දෙනෙකි.

බුදුරජුන් තරම් නිදහස් ව සිතන්නට, අදහස් ප්‍රකාශ කරන්නට මඟ පාද දුන් අනෙක් ආගමික ශාස්තෘවරයකු නැති බව කීම අගතියට යෑමෙක් නොවේ.

විශේෂයෙන් අවර දිගුන් බුදුදහමට ලැදි කම් දක්වන එක් ප්‍රධාන හේතුවක් ඇත. එය බුද්ධ ධර්මයේ නිදහස් චින්තනයට ප්‍රජාතාන්ත්‍රික ක්‍රමයට දී තිබෙන උසස් තත්ත්වය යි. එහෙත් මේ ප්‍රජාතන්ත්‍ර වාදය පුහුදුන් මිනිසා විසින් පරිහරණය කරණ දෑයක් නිසා එය සර්වතොභද්‍ර හැටියට සළකා ''වල් බූරු නිදහසට'' ඉඩ නො තැබිය යුතු සැටිත් උන්වහන්සේ මහත් අනුකම්පා බුද්ධියෙන් කියා දෙන සේක.

අද අපරදිග, විශේෂයෙන් යුරෝපයේ හා ඇමෙරිකානු රටවල බෞද්ධ සමිති පමණක් නොව බෞද්ධ විහාරයන් හා

ආයතනයන් ද දක්ක හැකිය. බුදුදහම පිළිබඳ ලියවුණු පොතපත ද බොහෝ ය. බුදුදහම පිළිගෙන බෞද්ධයන් හැටියට කල් ගත කරන අයද සිටිති. බුදුදහමේ මිත්‍රයන් මෙන් ක්‍රියාකරන, බුදුරජාණන් වහන්සේගේ නිර්මල චරිතාපදානයට මෙන්ම බුදුදහමට ද ලැදිකම් දක්වන, එයට ශීර්ෂප්‍රනාමය කරන අය ද බොහෝ රට වලදී දක්ක හැකි ය. එහෙත් හැම අවර දිග රටකම දහස් ගණනින් මිනිසුන් බුඩාගම පිළිගෙන බෞඩයන් වෙතැයි කීම අධිකොක්තියක්, වැඩියෙන් කීමක් පමණි. අද බෞඩයන් වැඩි ගණනක් ඇත්තේ එංගලන්තයේ ය. ජර්මනිය, ප්‍රංශය යන දෙරටෙහිත් සෑහෙන පමණක් බෞඩයෝ සිටිති. ඇමෙරිකානු එක්සත් ජනපදයේ ඇතැම් කෙනෙකු සිතන තරමට දහස් ගණන් බෞඩයෝ නැත. කැලිෆෝනි- යාවේ සිටින දහස් ගණන් බෞද්ධයන් ජපන් ජාතිකයෝ ය. එහෙත් බොහෝ රටවල ටික දෙනෙක් නමුත් බෞඩයන් සිටින බව ඇත්තෙකි. ඈත අයිස්ලන්තයේ ද බෞඩයන් නැත්තේ නොවේ. නොයෙක් රටවල ටිකෙන් ටික සෙමින් සෙමින් නමුත් බුද්ධ භක්තිකයන්ගේ ගණන වැඩි වෙන බවද කිය හැකිය. බුදුදහමට ලැදිකම් දක්වන, එය මෙකලට ගැළපෙන උතුම් ධර්මයක්, දර්ශනයක්සේ පිළිගන්නා සැළකිය යුතු පිරිසක් නම් සෑම රටකම සිටින බව නිර්භයව, නිසැකව කිය හැකි ය.

විදේශයන්හි ධර්මදූත මෙහෙයෙහි යෙදෙන්නවුන් විසින් ඒ ඒ රටවැසියන්ගේ පරිසරය, පසුබිම ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ හා ආගම් පිළිබඳවද තරමකවත් දැනීමක් ඇතිව හැකිතරම් ඔවුන්ගේ චිත්තාචාරය තේරුම්ගෙන න්‍යායානුකූලව ශාස්ත්‍රීය ප්‍රතිපත්තීන් උල්ලඞඝනය නො කොට, මහත් ඉවසීමකින් යුතු ව බුදුදහම පිළිබඳ කරුණු ඉදිරිපත් කළ යුතු ය. ස්වකීය චරිතයෙන්ම දෙන ආදර්ශය ද බොහෝ වටනේ ය. එය අවරදිගුන් තුළ බලපායි. ධර්මදූතයන් විසින් දුක් විඳගෙන, බාධා මැඩගෙන, ඉවසීමෙන් යුතුව සිය කාර්යය සිදුකළ යුතු ය. අපට ඇති ලොකුම පාඩුව නම් ධර්මදූතයන්ගේ හිඟකම ය. මේ සඳහා සුළු පිරිසක්වත් පුහුණුවිය යුතු ය. එබන්දන් මහ උගතුන්, දර්ශනිකයන්, ලේඛකයන් ම විය යුතු නො වේ. එසේ හැකිනම් වඩාත් හොඳ ය. අවශ්‍යවන්නේ බුදුදහම ගැන පැහැදිලි දැනීමක් ඇති, භාවනා පිළිබඳ කරුණු කියාදිය හැකි, ස්වකීය පැවැත්මෙන් ම ආදර්ශයක් දිය හැකි, දුක් විඳිය හැකි ඉවසිලිමත් පිරිසකි. බොහෝ රටවල අපගේ කථා ඇසීමට සාකච්ඡා කිරීමට භාවනා කිරීමට පැමිණි බොහෝ දෙනා උපතින් ක්‍රිස්තුභක්තිකයන් කතෝලිකයන් බව කිවයුතු ය.

'සබ්බ සාධාරණා භොගා'
භවභෝග සම්පත් කාට කාටත් පොදු දේ.